# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1999/26 - 2016 දෙසැම්බර් මස 27 වැනි අඟහරුවාදා - 2016.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

තංගල්ල රණවිරු ස්මාරකයක් ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම.

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටුවේගොඩ ගමේ පල්ලික්කුඩාව නාගරික ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පිහිටි සර්වේ ජෙනරාල් විසින් පිළියෙල කරන ලද මු.පි.හ. 69 හා 2016.09.07 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.9210 ක් පමණ වන කච්චේරි වලව්වත්ත *නොහොත්* සර්වේ අන්තෝනි මහත්තය හිටපු වත්ත නැමැති ඉඩමට මායිම්.

*උතුරට*: මාතර පාර සහ මාතර පාරේ සහ වරිපනම් අංක 359, සිප්පිගතිමා හිමිකම් කියන සිසන්වත්ත; *නැගෙනහිරට*: මාතර පාරේ වරිපනම් අංක 359 සිප්පිගතිමා හිමිකම් කියන සිසන්වත්ත සහ මුහුද; *දකුණට*: මුහුද ; *බටහිරට*: මුහුද සහ මාතර පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි ඉඩම.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 පෙබරවාරි මස 08 වැනි දින පෙ. ව. 9.30 ට තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 පෙබරවාරි මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එන්. ඩබ්ලිව්. යාපා,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
තංගල්ල.

2016 දෙසැම්බර් මස 22 වැනි දින,<br>
තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 286